# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

# 1986 අංක 39 දරන මහා නගර සභා සහ නගර සභා (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1986 නොවැම්බර් මස 12 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

1986 නොවැම්බර් මස 14 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිළ : රු. 1.65 | තැපැල් ගාස්තුව : රු. 1.15

# 1986 අංක 39 දරන මහා නගර සභා සහ නගර සභා (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1986 නොවැම්බර් මස 12 වන දින.]

එල්. ඩී.—ඕ. 58/85

මහා නගර සභා ආඥාපනත සහ නගර සභා ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1986 අංක 39 දරන මහා නගර සභා සහ නගර සභා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

## I වන කොටස

2. 1967 අංක 2 දරන පනතින් අවසන්වරට සංශෝධනය කරන ලද (මෙහි මෙම කොටසෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) මහා නගර සභා ආඥාපනතේ 10 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:— 252 අධිකාරයේ 10 වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "එසේ ආරම්භ වීමෙන් පසුව" යන වචනවල සිට ඒ උපවගන්තියේ අවසානය දක්වා වූ සියලු වචන වෙනුවට පහත දැක්වෙන වචන ආදේශ කිරීමෙන් :—

"ඒ සභිකයාගේ මරණය, ඉල්ලා අස්වීම හෝ ඉවත් කිරීම හේතු කොට ගෙන ඔහුගේ ධුරය කලින් හිස් කරනු ලැබුවේ නම් මිස, ඒ ධුර කාලය ආරම්භ වූ දිනයේ සිට මාස හතලිස් අටක කාලයක් සඳහා ඒ සභිකයා ධුරය දැරිය යුතු ය;" තව ද

(ආ) ඒ වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් —

"(2) අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින්—

(අ) ධුර කාලය අවසන් වන දිනය වෙනුවට ඒ වර්ෂයේ හෝ ඒ වර්ෂයට පෙරාතුව ම වූ වර්ෂයේ ඒ ධුර කාලය අවසන් වන මාසයට පෙරාතුව වූ යම් මාසයක දිනයක් ආදේශ කිරීම නියම කිරීමෙන් (1) වන උපවගන්තියේ සඳහන් ධුර කාලය කෙටි කළ හැකි ය; තව ද

(ආ) (1) වන උපවගන්තිය යටතේ ධුර කාලය අවසන් වන දිනය වෙනුවට හෝ මේ උපවගන්තියේ (අ) ඡේදය යටතේ නියම කරනු ලබන දිනය වෙනුවට, ඒ වර්ෂයේ හෝ එසේ නිශ්චිතව සඳහන් කරන ලද හෝ නියම කරන ලද වර්ෂයට ඉක්බිති ව වූ යම් වර්ෂයක ධුර කාලය අවසන් වන දිනයට පසුව වූ යම් මාසයක දිනයක් නියම කිරී

මෙන් එකී ධූර කාලය දීර්ඝ කළ හැකි අතර, ඉන් පසුව, අවසාන නියමයේ නිශ්චිතව සඳහන් ධූර කාලය අවසාන වන දිනය වෙනුවට පසුව වූ යම් දිනයක් නියම කිරීමෙන් එකී ධූර කාලය කලින් කල දීර්ඝ කළ හැකි ය:

එසේ වුව ද, ඒ ධූර කාලය දීර්ඝ කරන කාල සීමාව හෝ ඒ ධූරකාලය කලින් කල දීර්ඝ කරන කාල සීමාවල එකතුව මාස දොළහකට වැඩි නො විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 40 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. 1983 අංක 13 දරන පනතින් සංශෝධනය කරන ලද ප්‍රධාන ප්‍රඥප්තියේ 40 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (1983 අංක 13 දරන පනතින් ඇතුළත් කරන ලද) (දද) වන ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් ඒ වගන්තියේ (1) වන උපවගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(දදද) අමාත්‍යවරයාගේ පූර්ව අනුමතය ඇතිව—

(i) මහා නගර සභා ආඥාපනත සහ නගර සභා ආඥා පනත යටතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ පිළිවෙලින් යම් මහා නගර සභාවක් විසින් හෝ නගර සභාවක් විසින් පිහිටුවා පවත්වා ගෙන යනු ලබන, අවශ්‍යාවෝචිත පරිදි, පොදු සේවාවන් හෝ මහජන අර්ථකාරී සේවාවන් සඳහා අවශ්‍ය විය හැකි යන්ත්‍රෝපකරණ, උප කරණ, භාණ්ඩ, ද්‍රව්‍ය සහ බඩු නිෂ්පාදනය සහ සැදීම සඳහා වාණිජ සහ කර්මාන්ත ව්‍යවසායවල නිරතවීම ; සහ

(ii) ඒ යන්ත්‍රෝපකරණ, උපකරණ, භාණ්ඩ, ද්‍රව්‍ය හෝ බඩු සභාව විසින් තීරණය කොට අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන මිල ගණන්වලට වෙනත් යම් මහා නගර සභාවකට හෝ නගර සභාවකට හෝ මහජනයාට විකිණීමට.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 73 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 73 වන වගන්තියේ (2) වන උපවගන්තියේ "වරදකරු කරනු ලැබූ විට රුපියල් පනහකට නොවැඩි දඩයකට යටත් වන්නේ ය." යන වචන වෙනුවට, "වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්සියයකට නොවැඩි දඩයකට යටත් වන්නේ ය." යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 74 වන වගන්තිය සංශෝධනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 74 වන වගන්තියේ (2) වන උපවගන්තියේ "වරදකරු කරනු ලැබූ විට රුපියල් පනහකට නොවැඩි දඩයකට යටත් වන්නේ ය." යන වචන වෙනුවට "වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්සියයකට නොවැඩි දඩයකට යටත් වන්නේ ය." යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 78 වන වගන්තියේ "වරදකරු කරනු ලැබූ විට රුපියල් පනහකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතු ය. එම වරද නොකඩව කරගෙන යන අවස්ථාවක නම්, ඒ වරදට ඔහු වරදකරු කරනු ලැබීමෙන් පසු ඒ වරද කරගෙන යන එක් එක් දවස සඳහා රුපියල් විසිපහකට නොවැඩි අතිරේක දඩයකට ද ඔහු යටත් විය යුතු ය;" යන වචන වෙනුවට, "වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්සියයකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතු ය. එම වරද නොකඩව කරගෙන යන අවස්ථාවක නම්, ඒ වරදට ඔහු වරදකරු කරනු ලැබීමෙන් පසු ඒ වරද කරගෙන යන එක් එක් දවස සඳහා රුපියල් දෙසිය පනහකට නොවැඩි අතිරේක දඩයකට ද ඔහු යටත් විය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 78 වන වගන්තිය සංශෝධනය කිරීම.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 79 වන වගන්තියේ "වරදකරු කරනු ලැබූ විට රුපියල් පනහකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතු ය." යන වචන වෙනුවට "වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්සියයකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතුය.". යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 79 වන වගන්තිය සංශෝධනය කිරීම.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 81 වන වගන්තියේ "වරදකරු කරනු ලැබූ විට රුපියල් පනහකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතු ය." යන වචන වෙනුවට "වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්සියයකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතුය.". යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 81 වන වගන්තිය සංශෝධනය කිරීම.

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 83 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 83 වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "වරදකරු කරනු ලැබූ විට රුපියල් පනහකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතුය:" යන වචන වෙනුවට "වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්සියයකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතු ය:" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ "වරදකරු කරනු ලැබූ විට රුපියල් පනහකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතුය." යන වචන වෙනුවට "වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්සියයකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන්;

(ඇ) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ "වරදකරු කරනු ලැබූ විට රුපියල් පනහකට නොවැඩි දඩයකට ද, ඒ වරද නොකඩව කරගෙන යන අවස්ථාවක නම්, ඒ වරදට ඔහු වරදකරු කරනු ලැබීමෙන් පසු ඒ වරද කරගෙන යන එක් එක් දිනය සඳහා රුපියල් විසිපහක් නොඉක්මවන අතිරේක දඩයකට ඔහු යටත් විය යුතු ය." යන වචන වෙනුවට "වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්සියය

කට නොවැඩි දඩයකට ද, එම වරද නොකඩව කරගෙන යන අවස්ථාවක නම්, ඒ වරදට ඔහු වරදකරු කරනු ලැබීමෙන් පසු ඒ වරද කරගෙන යන එක් එක් දිනය සඳහා රුපියල් දෙසිය පනහකට නොවැඩි අතිරේක දඩයකටද ඔහු යටත් විය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන්; සහ

(ඇ) ඒ වගන්තියේ (4) වන උපවගන්තියේ "වරදකරු කරනු ලැබූ විට රුපියල් පනහකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතු ය." යන වචන වෙනුවට "වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්සියයකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 84 වන වගන්තිය සංශෝධනය කිරීම.

10. ප්‍රධාන ප්‍රඥප්තියේ 84 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(අ) ඒ වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(2) (1) වන උපවගන්තිය යටතේ අල්ලා ගනු ලැබූ කිසිම සතෙකු ඒ සතා අල්ලා ගනු ලැබුවේ කවර තැනැත්තකු විසින් ද, ඒ තැනැත්තාගේ ප්‍රයෝජනය සඳහා ද, ඒ සතා කොටුවේ තබාගෙන සිටියා වූ එක් එක් දිනය සඳහා ද සභාව විසින් තත් ප්‍රාදේශීය තත්ත්වයන් සැලකිල්ලට ගෙන කලින් කලට යෝජනා සම්මතයක් මගින් නියම කරනු ලැබිය හැකි යම් මුදල් ප්‍රමාණයක් ගෙවනු ලැබුවහොත් මිස, ඒ සතාගේ අයිතිකරුට භාර නොදිය යුතු ය.".

(ආ) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ "රුපියල් දෙකක් හෝ" යන වචනවල සිට "මුදලක් ගෙවීමෙන් පසුව" යන වචන දක්වා වූ සියලු වචන වෙනුවට පහත දැක්වෙන වචන ආදේශ කිරීමෙන් :—

"එම සතා අල්ලාගනු ලැබූ තැනැත්තා වෙත සහ කොටුවේ තබා ගැනීම සහ නඩත්තුව වෙනුවෙන් එක් එක් දිනයන් සඳහා තත් ප්‍රාදේශීය තත්ත්වයන් සැලකිල්ලට ගෙන සභාව විසින් කලින් කලට යෝජනා සම්මත මගින් නියම කරනු ලැබිය හැකි මුදල් ප්‍රමාණයක් ගෙවීමෙන් පසුව.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 85 වන වගන්තිය සංශෝධනය කිරීම.

11. ප්‍රධාන ප්‍රඥප්තියේ 85 වන වගන්තියේ "වරදකරු කරනු ලැබූ විට රුපියල් පනහකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතු ය." යන වචන වෙනුවට "වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්සියයකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

12. ප්‍රධාන ප්‍රඥප්තියේ 93 වන වගන්තියේ "වරදකරු කරනු ලැබූ විට රුපියල් පනහකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතුය." යන වචන වෙනුවට "වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්සියයකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතුය." යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 93 වන වගන්තිය සංශෝධනය කිරීම.

13. ප්‍රධාන ප්‍රඥප්තියේ 101 වන වගන්තියේ "වරදකරු කරනු ලැබූ විට රුපියල් පනහකට නොවැඩි දඩයකට ද ඒ වරද නොකඩව කරගෙන යන අවස්ථාවක නම්, ඒ වරදට ඔහු වරදකරු කරනු ලැබීමෙන් පසු ඒ වරද කරගෙන යන එක් එක් දිනය සඳහා රුපියල් විසිපහක් නො ඉක්මවන අතිරේක දඩයකට ද ඔහු යටත් විය යුතුය." යන වචන වෙනුවට "වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්සියයකට නොවැඩි දඩයකට ද ඒ වරද නොකඩව කරගෙන යන අවස්ථාවක නම්, ඒ වරදට ඔහු වරදකරු කරනු ලැබීමෙන් පසු ඒ වරද කරගෙන යන එක් එක් දිනය සඳහා රුපියල් දෙසිය පනහකට නොවැඩි අතිරේක දඩයකට ද ඔහු යටත් විය යුතුය." යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 101 වන වගන්තිය සංශෝධනය කිරීම.

14. ප්‍රධාන ප්‍රඥප්තියේ 102 වන වගන්තියේ "වරදකරු කරනු ලැබූ විට රුපියල් පනහකට නොවැඩි දඩයකට ද ඒ වරද නොකඩව කරගෙන යන අවස්ථාවක නම්, ඒ වරදට ඔහු වරදකරු කරනු ලැබීමෙන් පසු ඒ වරද කරගෙන යන එක් එක් දිනය සඳහා රුපියල් දහයක් නො ඉක්මවන අතිරේක දඩයකට ද ඔහු යටත් විය යුතුය." යන වචන වෙනුවට "වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්සියයකට නොවැඩි දඩයකට ද ඒ වරද නොකඩව කරගෙන යන අවස්ථාවක නම්, ඒ වරදට ඔහු වරදකරු කරනු ලැබීමෙන් පසු ඒ වරද කරගෙන යන එක් එක් දිනය සඳහා රුපියල් එක් සියයකට නොවැඩි අතිරේක දඩයකට ද ඔහු යටත් විය යුතුය." යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 102 වන වගන්තිය සංශෝධනය කිරීම.

15. ප්‍රධාන ප්‍රඥප්තියේ 103 වන වගන්තියේ (1) වන උප වගන්තියේ "වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් සියයකට නොවැඩි දඩයකට ද ඒ වරද නොකඩව කරගෙන යන අවස්ථාවක නම්, ඒ වරදට ඔහු වරදකරු කරනු ලැබීමෙන් පසු ඒ වරද කරගෙන යන එක් එක් දිනය සඳහා රුපියල් විසිපහක් නොඉක්මවන අතිරේක දඩයකට ද ඔහු යටත් විය යුතුය." යන වචන වෙනුවට "වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් දහසකට නොවැඩි දඩයකට ද ඒ වරද නොකඩව කරගෙන යන අවස්ථාවක නම්, ඒ වරදට ඔහු වරදකරු කරනු ලැබීමෙන් පසු ඒ වරද කරගෙන යන එක් එක් දිනය සඳහා රුපියල් දෙසිය පනහකට නොවැඩි අතිරේක දඩයකට ද ඔහු යටත් විය යුතුය." යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 103 වන වගන්තිය සංශෝධනය කිරීම.

ප්‍රධාන ප්‍රඥප්තියේ 104 වන වගන්තිය සංශෝධනය කිරීම.

**16.** ප්‍රධාන ප්‍රඥප්තියේ 104 වන වගන්තියේ (1) වන උප වගන්තියේ "වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් සියයකට නොවැඩි දඩයකට ද ඒ වරද නොකඩව කරගෙන යන අවස්ථාවක නම් ඒ වරදට ඔහු වරදකරු කරනු ලැබීමෙන් පසු ඒ වරද කරගෙන යන එක් එක් දිනය සඳහා රුපියල් විසිපහක් නො ඉක්මවන අතිරේක දඩයකට ද ඔහු යටත් විය යුතුය." යන වචන වෙනුවට "වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් දහසකට නොවැඩි දඩයකට ද ඒ වරද නොකඩව කරගෙන යන අවස්ථාවක නම් ඒ වරදට ඔහු වරදකරු කරනු ලැබීමෙන් පසු ඒ වරද කරගෙන යන එක් එක් දිනය සඳහා රුපියල් දෙසිය පනහකට නොවැඩි අතිරේක දඩයකට ද ඔහු යටත් විය යුතුය." යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 105 වන වගන්තිය සංශෝධනය කිරීම.

**17.** ප්‍රධාන ප්‍රඥප්තියේ 105 වන වගන්තියේ (2) වන උප වගන්තියේ "වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් සියයකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතුය." යන වචන වෙනුවට "වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් දහසකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතුය." යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 106 වන වගන්තිය සංශෝධනය කිරීම.

**18.** ප්‍රධාන ප්‍රඥප්තියේ 106 වන වගන්තියේ (2) වන උප වගන්තියේ "වරදකරු කරනු ලැබූවිට රුපියල් දෙසිය පනහකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතුය." යන වචන වෙනුවට "වරදකරු කරනු ලැබූ විට රුපියල් දෙදහස් පන්සියයකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතුය." යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 107 වන වගන්තිය සංශෝධනය කිරීම.

**19.** ප්‍රධාන ප්‍රඥප්තියේ 107 වන වගන්තියේ (2) වන උප වගන්තියේ "වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් සියයකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතුය." යන වචන වෙනුවට "වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් දහසකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතුය." යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 108 වන වගන්තිය සංශෝධනය කිරීම.

**20.** ප්‍රධාන ප්‍රඥප්තියේ 108 වන වගන්තියේ (3) වන උප වගන්තියේ "වරදකරු කරනු ලැබූ විට රුපියල් පනහකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතුය." යන වචන වෙනුවට "වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්සියයකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතුය." යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 109 වන වගන්තිය සංශෝධනය කිරීම.

**21.** ප්‍රධාන ප්‍රඥප්තියේ 109 වන වගන්තියේ (11) වන උප වගන්තියේ "වරදකරු කරනු ලැබූ විට රුපියල් පනහකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතුය." යන වචන වෙනුවට "වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්සියයකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතුය." යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**22.** ප්‍රධාන ප්‍රඥප්තියේ 110 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 110 වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) ඒ වගන්තියේ (5) වන උපවගන්තියේ "වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් සියයක් නො ඉක්මවන දඩයකට යටත් විය යුතු ය ;" යන වචන වෙනුවට සහ "වරදකරු කරනු ලැබූ විට ඒ වරද නොනවත්වා කරගෙන ගිය එක් එක් දවස සඳහා රුපියල් විසිපහක් නො ඉක්මවන දඩයකට ද ඔහු යටත් විය යුතු ය." යන වචන වෙනුවට පිළිවෙලින්, "වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් දහසකට නො වැඩි දඩයකට යටත් විය යුතුය ;" සහ "වරදකරු කරනු ලැබූ විට ඒ වරද නොකඩව කරගෙන ගිය එක් එක් දිනය සඳහා රුපියල් දෙසිය පනහකට නො වැඩි දඩයකට ද ඔහු යටත් විය යුතුය." යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ආ) ඒ වගන්තියේ (7) වන උපවගන්තියේ "වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් සියයක් නො ඉක්මවන දඩයකට ඔහු යටත් විය යුතුය." යන වචන වෙනුවට "වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් දහසකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතුය." යන වචන ආදේශ කිරීමෙන්.

**23.** ප්‍රධාන ප්‍රඥප්තියේ 111 වන වගන්තියේ (4) වන උපවගන්තියේ "වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් සියයක් නොඉක්මවන දඩයකට ඔහු යටත් විය යුතුය ;" යන වචන වෙනුවට සහ "වරදකරු කරනු ලැබූ විට ඒ වරද නොකඩවා කරගෙන යන එක් එක් දිනය සඳහා රුපියල් විසිපහක් නොඉක්මවන දඩයකටද ඔහු යටත් විය යුතුය." යන වචන වෙනුවට පිළිවෙලින් "වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් දහසකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතුය ;" යන වචන සහ "වරදකරු කරනු ලැබූ විට ඒ වරද නොකඩව කරගෙන ගිය එක් එක් දිනය සඳහා රුපියල් දෙසිය පනහකට නොවැඩි දඩයකට ද ඔහු යටත් විය යුතුය." යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 111 වන වගන්තිය සංශෝධනය කිරීම.

**24.** ප්‍රධාන ප්‍රඥප්තියේ 112 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 112 වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) ඒ වගන්තියේ (4) වන උපවගන්තියේ "වරදකරු කරනු ලැබූ විට රුපියල් පනහකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතුය." යන වචන වෙනුවට "වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්සියයකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතුය." යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ආ) ඒ වගන්තියේ (6) වන උපවගන්තියේ "වරදකරු කරනු ලැබූ විට රුපියල් පනහකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතුය." යන වචන වෙනුවට "වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්සියයකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතුය." යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 113 වන වගන්තිය සංශෝධනය කිරීම.

**25.** ප්‍රධාන ප්‍රඥප්තියේ 113 වන වගන්තියේ (2) වන උප වගන්තියේ "වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් සියයකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතුය." යන වචන වෙනුවට "වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් දහසකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතුය." යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 115 වන වගන්තිය සංශෝධනය කිරීම.

**26.** ප්‍රධාන ප්‍රඥප්තියේ 115 වන වගන්තියේ (2) වන උප වගන්තියේ "වරදකරු කරනු ලැබූ විට රුපියල් පනහක් නොඉක්මවන දඩයකට ඔහු යටත් විය යුතුය;" යන වචන වෙනුවට සහ "වරදකරු කරනු ලැබූ විට ඒ වරද නොකඩව කරගෙන යන එක් එක් දිනය සඳහා රුපියල් විසිපහකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතුය." යන වචන වෙනුවට පිළිවෙලින් "වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්සියයකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතුය;" යන වචන සහ "වරදකරු කරනු ලැබූ විට ඒ වරද නොකඩව කරගෙන යන එක් එක් දිනය සඳහා රුපියල් දෙසිය පනහකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතුය." යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 116 වන වගන්තිය සංශෝධනය කිරීම.

**27.** ප්‍රධාන ප්‍රඥප්තියේ 116 වන වගන්තියේ (1) වන උප වගන්තියේ "වරදකරු කරනු ලැබූ විට රුපියල් පනහක් නොඉක්මවන දඩයකට ඔහු යටත් විය යුතුය." යන වචන වෙනුවට සහ "වරදකරු කරනු ලැබූ විට ඒ වරද නොකඩව කරගෙන යන එක් එක් දිනය සඳහා රුපියල් විසිපහකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතුය." යන වචන වෙනුවට පිළිවෙලින් "වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්සියයකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතුය." යන වචන සහ "වරදකරු කරනු ලැබූ විට ඒ වරද නොකඩව කරගෙන යන එක් එක් දිනය සඳහා රුපියල් දෙසිය පනහකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතුය." යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 117 වන වගන්තිය සංශෝධනය කිරීම.

**28.** ප්‍රධාන ප්‍රඥප්තියේ 117 වන වගන්තියේ (6) වන උප වගන්තියේ "වරදකරු කරනු ලැබූ විට රුපියල් පනහකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතුය." යන වචන වෙනුවට සහ "වරදකරු කරනු ලැබූ විට. ඒ වරද නොකඩව කරගෙන යන එක් එක් දිනය සඳහා රුපියල් විසිපහක් නොඉක්මවන දඩයකට ද ඔහු යටත් විය යුතුය." යන වචන වෙනුවට පිළිවෙලින් "වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්සියයකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතුය." යන වචන සහ "වරදකරු කරනු ලැබූ විට ඒ වරද නොකඩව කරගෙන යන එක් එක් දිනය සඳහා රුපියල් දෙසිය පනහකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතුය." යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරන ලැබේ.

**29.** ප්‍රධාන ප්‍රඥප්තියේ 118 වන වගන්තියේ (2) වන උප වගන්තියේ "වරදකරු කරනු ලැබූ විට රුපියල් පනහකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතුය ;" යන වචන වෙනුවට "වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්සියයකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 118 වන වගන්තිය සංශෝධනය කිරීම.

**30.** ප්‍රධාන ප්‍රඥප්තියේ 119 වන වගන්තියේ (3) වන උප වගන්තියේ "වරදකරු කරනු ලැබූ විට රුපියල් දෙසියයකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතු ය." යන වචන වෙනුවට "වරදකරු කරනු ලැබූ විට රුපියල් දෙදහසකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 119 වන වගන්තිය සංශෝධනය කිරීම.

**31.** ප්‍රධාන ප්‍රඥප්තියේ 120 වන වගන්තියේ (2) වන උප වගන්තියේ "වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් සියයක් නොඉක්මවන දඩයකට ඔහු යටත් විය යුතු ය ;" යන වචන වෙනුවට "වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් දහසකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 120 වන වගන්තිය සංශෝධනය කිරීම.

**32.** ප්‍රධාන ප්‍රඥප්තියේ 121 වන වගන්තියේ (2) වන උප වගන්තියේ "වරදකරු කරනු ලැබූ විට රුපියල් පනහකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතු ය ;" යන වචන වෙනුවට සහ "වරදකරු කරනු ලැබූ විට ඒ වරද නොකඩව කරගෙන යන එක් එක් දිනය සඳහා රුපියල් විසිපහක් නොඉක්මවන දඩයකට ද ඔහු යටත් විය යුතු ය." යන වචන වෙනුවට පිළිවෙලින් "වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්සියයකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතුය ;" යන වචන සහ "වරදකරු කරනු ලැබූ විට ඒ වරද නොකඩව කරගෙන යන එක් එක් දිනය සඳහා රුපියල් දෙසිය පනහකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 121 වන වගන්තිය සංශෝධනය කිරීම.

**33.** ප්‍රධාන ප්‍රඥප්තියේ 124 වන වගන්තියේ "වරදකරු කරනු ලැබූ විට ඒ ආඥාවෙන් අනතුරුව ඒ තදබදය දිගටම පැවැති එක් එක් දිනය සඳහා රුපියල් විසිපහක් නොඉක්මවන දඩයකට ඔහු යටත් විය යුතු ය." යන වචන වෙනුවට "වරදකරු කරනු ලැබූ විට ඒ ආඥාවෙන් අනතුරුව ඒ තදබදය දිගටම පැවැති එක් එක් දිනය සඳහා රුපියල් දෙසිය පනහකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 124 වන වගන්තිය සංශෝධනය කිරීම.

ප්‍රධාන ප්‍රඥප්තියේ 127 වන වගන්තිය සංශෝධනය කිරීම.

**34.** ප්‍රධාන ප්‍රඥප්තියේ 127 වන වගන්තියේ (3) වන උප වගන්තියේ "වරදකරු කරනු ලැබූ විට රුපියල් විසිපහකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතු ය." යන වචන වෙනුවට "වරදකරු කරනු ලැබූ විට රුපියල් දෙසිය පනහකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 134 වන වගන්තිය සංශෝධනය කිරීම.

**35.** ප්‍රධාන ප්‍රඥප්තියේ 134 වන වගන්තියේ "වරදකරු කරනු ලැබූ විට රුපියල් දහයක් නොඉක්මවන දඩයකට ඔහු යටත් විය යුතු ය." යන වචන වෙනුවට "වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් සියයක් නොඉක්මවන දඩයකට ඔහු යටත් විය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 135 වන වගන්තිය සංශෝධනය කිරීම.

**36.** ප්‍රධාන ප්‍රඥප්තියේ 135 වන වගන්තියේ (2) වන උප වගන්තියේ "වරදකරු කරනු ලැබූ විට රුපියල් පනහක් නොඉක්මවන දඩයකට ඔහු යටත් විය යුතු ය." යන වචන වෙනුවට "වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්සියයකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 136 වන වගන්තිය සංශෝධනය කිරීම.

**37.** ප්‍රධාන ප්‍රඥප්තියේ 136 වන වගන්තියේ "වරදකරු කරනු ලැබූ විට රුපියල් පනහකට නොවැඩි දඩයකට ද, ඒ වරද නොකඩවා කරගෙන යන අවස්ථාවක නම්, ඒ වරදට ඔහු වරදකරු කරනු ලැබීමෙන් පසු ඒ වරද කරගෙන යන එක් එක් දිනය සඳහා රුපියල් දහයකට නොවැඩි අතිරේක දඩයකට ද ඔහු යටත් විය යුතු ය." යන වචන වෙනුවට "වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්සියයකට නොවැඩි දඩයකට ද ඒ වරද නොකඩවා කර ගෙන යන අවස්ථාවක නම් ඒ වරදට ඔහු වරදකරු කරනු ලැබීමෙන් පසු එම වරද කර ගෙන යන එක් එක් දිනය සඳහා රුපියල් එක් සියයකට නොවැඩි අතිරේක දඩයකට ද ඔහු යටත් විය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 136අ වගන්තිය සංශෝධනය කිරීම

**38.** (1979 අංක 42 දරන පනතින් ඇතුළත් කරන ලද) ප්‍රධාන ප්‍රඥප්තියේ 136අ වගන්තියේ (1) වන උපවගන්තියේ "කොළඹ මහා නගර සභාවේ පාලන සීමා තුළ" යන වචන වෙනුවට "යම් මහා නගර සභාවක පාලන සීමා තුළ" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 136ආ අළුත් වගන්තිය ඇතුළත් කිරීම.

**39.** ප්‍රධාන ප්‍රඥප්තියේ 136අ වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අළුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ඒ ප්‍රඥප්තියේ 136ආ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය :—

"තැනැත්තන්ගේ හෝ දේපළක ආරක්ෂාවට තර්ජනයක් වන ගස් හෝ ගස්වල අතු හෝ කඳන් හෝ ගෙඩි සම්බන්ධයෙන් නගරාධිපතිවරයාගේ බලතල.

136ආ. යම් මහා නගර සභා ප්‍රදේශයක් තුළ වූ යම් ගසකින් හෝ ගසක යම් අත්තකින්, කඳකින්, ගෙඩියකින් හෝ වෙනත් කොටසකින් යම් ගොඩනැගිල්ලකට අලාභ හානියක් සිදුවන හෝ අලාභ හානි සිදුවීමට ඉඩ ඇති හෝ අවස්ථාවක නැතහොත් එය, යම් ගොඩනැගිල්ලක පදිංචිකරුවන්ට හෝ යම් ප්‍රසිද්ධ මහා මාර්ගයක ගමන් කරන්නන්ගේ ආරක්ෂාවට අනතුරුදායක තත්ත්වයක පවතින අවස්ථාවක, නගරාධිපතිවරයා විසින් ඒ ගස පිහිටියා වූ ඉඩමේ අයිතිකරු වෙත හෝ පදිංචිකරු වෙත ලියවිල්ලකින් වූ දැන්වීමක් භාරදීමෙන්, ඒ දැන්වීමේ නිශ්චිතව සඳහන් කරනු ලබන කාලයක් ඇතුළත ඒ ගස බැඳ තැබීමට සහ ආරක්ෂාවට අනතුරුදායක නොවන ලෙස තැබීමට හෝ ඒ ගස හෝ ගසේ අත්ත, කඳ, ගෙඩි හෝ වෙනත් යම් කොටසක් කපා ඉවත් කිරීමට ඒ අයිතිකරුට හෝ පදිංචිකරුට නියම කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ දැන්වීමක් භාරදෙනු ලැබූ සෑම තැනැත්තකුම, ඒ දැන්වීමේ නිශ්චිතව සඳහන් කරන ලද කාලය ඇතුළත ඒ දැන්වීමේ තර ඇති නියමයන් ඉටු කළ යුතු ය; ඒ කාලය ඇතුළත, ඒ තැනැත්තන් විසින් ඒ නියමයන් ඉටු කිරීම ප්‍රතික්ෂේප කර ඇති හෝ අතපසු කර ඇති විට, නගරාධිපතිවරයා හෝ නගරාධිපතිවරයා විසින් ලියවිල්ලකින් තත් කාර්යය සඳහා බලය පවරන ලද යම් නිලධරයෙක් හෝ කම්කරුවෙක් ඒ දැන්වීමේ සඳහන් ඉඩමට ඇතුල් වී, ඒ දැන්වීමෙන් ඒ තැනැත්තාට ඉටු කිරීමට නියම කරන ලද කටයුත්ත කරනු ලැබිය හැකි අතර, ඒ කටයුත්ත වෙනුවෙන් දරන ලද වියදම් සභාවට අයවිය යුතු ණයක් ලෙස ඒ තැනැත්තාගෙන් අය කර ගනු ලැබිය හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 137 වන වගන්තිය සංශෝධනය කිරීම.

**40.** ප්‍රධාන ප්‍රඥප්තියේ 137 වන වගන්තියේ (3) වන උප වගන්තියේ "වරදකරු කරනු ලැබූ විට ඔහු රුපියල් පන්සියයකට නොවැඩි දඩයකට" යන වචන වෙනුවට "වරදකරු කරනු ලැබූ විට ඔහු රුපියල් පන්දහසකට නොවැඩි දඩයකට" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 139 වන වගන්තිය සංශෝධනය කිරීම.

41. ප්‍රධාන ප්‍රඥප්තියේ 139 වන වගන්තියේ "වරදකරු කරනු ලැබූ විට රුපියල් පනහකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතු ය" යන වචන වෙනුවට "වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්සියයකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 140 වන වගන්තිය සංශෝධනය කිරීම.

42. ප්‍රධාන ප්‍රඥප්තියේ 140 වන වගන්තියේ (1) වන උප වගන්තියේ "වරදකරු කරනු ලැබූ විට රුපියල් පනහකට නොවැඩි දඩයකට ද" යන වචන වෙනුවට "වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්සියයකට නොවැඩි දඩයකට ද" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 141 වන වගන්තිය සංශෝධනය කිරීම.

43. ප්‍රධාන ප්‍රඥප්තියේ 141 වන වගන්තියේ "වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් සියයකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතු ය." යන වචන වෙනුවට "වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් දහසකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 158 වන වගන්තිය සංශෝධනය කිරීම.

44. ප්‍රධාන ප්‍රඥප්තියේ 158 වන වගන්තියේ "වරදකරු කරනු ලැබූ විට රුපියල් පනහකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතු ය." යන වචන වෙනුවට "වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්සියයකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 159 වන වගන්තිය සංශෝධනය කිරීම.

45. ප්‍රධාන ප්‍රඥප්තියේ 159 වන වගන්තියේ "වරදකරු කරනු ලැබූ විට රුපියල් විස්සකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතු ය." යන වචන වෙනුවට, "වරදකරු කරනු ලැබූ විට, රුපියල් දෙසීයයකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 180 වන වගන්තිය සංශෝධනය කිරීම.

46. ප්‍රධාන ප්‍රඥප්තියේ 180 වන වගන්තියේ "වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්සියයකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතුය." යන වචන වෙනුවට "වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්දහසකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 188 වන වගන්තිය සංශෝධනය කිරීම.

47. 1981 අංක 61 දරන පනතින් අවසාන වරට සංශෝධනය කරන ලද ප්‍රධාන ප්‍රඥප්තියේ 188 වන වගන්තියේ, (1) වන උපවගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:—

(අ) ඒ උපවගන්තියේ (ඕ) ඡේදයේ "විජිෂයකට එකතුව රුපියල් දහසක් නොඉක්මවන" යන වචන වෙනුවට "විජිෂයකට එකතුව රුපියල් දස දහසක් නොඉක්මවන" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ආ) ඒ උපවගන්තියේ (ග) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අළුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(ගග) සභිකයන්ගේ නිවාසස්ථානවලට නිල දුරකථන පහසුකම් සැපයීම සහ නඩත්තු කිරීම පිණිස සභාව විසින් දරනු ලබන සියලු වියදම් ;".

48. ප්‍රධාන ප්‍රඥප්තියේ 196 වන වගන්තියේ (5) වන උප වගන්තියේ "රුපියල් දෙසිය පනහකට නොවැඩි දඩයකට යටත් විය යුතු ය." යන වචන වෙනුවට "රුපියල් දෙදහස් පන්සියයකට නොවැඩි දඩයකට යටත් විය යුතුය" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 196 වන වගන්තිය සංශෝධනය කිරීම.

49. ප්‍රධාන ප්‍රඥප්තියේ 221 වන වගන්තියේ "වරදකරු කරනු ලැබූ විට රුපියල් සියයකට නොවැඩි දඩයකට ද" යන වචන වෙනුවට සහ "රුපියල් පනහකට නොවැඩි අතිරේක දඩයකට ද" යන වචන වෙනුවට පිළිවෙලින් "වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් දහසකට නොවැඩි දඩයකට ද" යන වචන සහ "රුපියල් පන්සියයකට නොවැඩි අතිරේක දඩයකට ද" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 221 වන වගන්තිය සංශෝධනය කිරීම.

50. ප්‍රධාන ප්‍රඥප්තියේ 227 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 227 වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) "ඇස්තමේන්තු කළ වියදම් රුපියල් එක්දහස් පන්සියය නොඉක්මවන්නා වූ ද" යන වචන වෙනුවට "ඇස්තමේන්තු කළ වියදම් රුපියල් පහළොස් දහස නොඉක්මවන්නා වූ ද" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ආ) ඒ වගන්තියේ පාර්ශ්ව සටහනෙහි "රුපියල් එක්දහස් පන්සියයක්" යන වචන වෙනුවට "රුපියල් පහළොස් දහසක්" යන වචන ආදේශ කිරීමෙන්.

51. ප්‍රධාන ප්‍රඥප්තියේ 228 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 228 වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) "වියදම රුපියල් එක් දහස් පන්සියය ඉක්මවන්නා වූ ද" යන වචන වෙනුවට "වියදම රුපියල් පහළොස් දහස ඉක්මවන්නා වූ ද" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ආ) ඒ පාර්ශ්ව සටහනෙහි "රුපියල් එක්දහස් පන්සියයක්" යන වචන වෙනුවට "රුපියල් පහළොස් දහසක්" යන වචන ආදේශ කිරීමෙන්.

52. 1985 අංක 20 දරන පනතින් අවසන් වරට සංශෝධනය කරන ලද ප්‍රධාන ප්‍රඥප්තියේ 230 වන වගන්තිය. ඒ වගන්තියේ (2) වන උපවගන්තියට ඉක්බිතිවම ම උපවගන්තිය ඉවත් කිරීමෙන් මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 230 වන වගන්තිය සංශෝධනය කිරීම.

ප්‍රධාන ප්‍රඥප්තියේ 234 වන වගන්තිය සංශෝධනය කිරීම.

**53.** ප්‍රධාන ප්‍රඥප්තියේ 234 වන වගන්තියේ (3) වන උප වගන්තියේ "වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් සියයකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතුය." යන වචන වෙනුවට "වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් දහසකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතුය." යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 247ආ වගන්තිය සංශෝධනය කිරීම.

**54.** (1979 අංක 42 දරන පනතින් ඇතුළත් කරන ලද) ප්‍රධාන ප්‍රඥප්තියේ 247ආ වගන්තියේ (4) වන උපවගන්තියේ "ඒ සභාව පිහිටි" යන වචන වෙනුවට සහ "ඒ සභාව විසින් වාර්තා කළ යුතුය" යන වචන වෙනුවට පිළිවෙළින් "සභාව පිහිටි" යන වචන සහ "කොමසාරිස්වරයා විසින් වාර්තා කළ යුතුය." යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 247ඇ වගන්තිය සංශෝධනය කිරීම.

**55.** 1985 අංක 20 දරන පනතින් සංශෝධනය කරන ලද (1979 අංක 42 දරන පනතින් ඇතුළත් කරන ලද) ප්‍රධාන ප්‍රඥප්තියේ 247ඇ වගන්තියේ (3) වන උපවගන්තියේ "ඒ සභාව පිහිටි" යන වචන වෙනුවට සහ "ඒ සභාව විසින් වාර්තා කළ යුතු ය" යන වචන වෙනුවට පිළිවෙළින්, "සභාව පිහිටි" යන වචන සහ "කොමසාරිස්වරයා විසින් වාර්තා කළ යුතුය" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 247ඉ වගන්තිය සංශෝධනය කිරීම.

**56.** 1985 අංක 20 දරන පනතින් සංශෝධනය කරන ලද (1979 අංක 42 දරන පනතින් ඇතුළත් කරන ලද) ප්‍රධාන ප්‍රඥප්තියේ 247ඉ වගන්තියේ (2) වන උපවගන්තියේ "ඒ සභාව විසින් වාර්තා කළ යුතුය" යන වචන වෙනුවට "කොමසාරිස්වරයා විසින් වාර්තා කළ යුතුය." යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 251 වන වගන්තිය සංශෝධනය කිරීම.

**57.** ප්‍රධාන ප්‍රඥප්තියේ 251 වන වගන්තියේ "වරදකරු කරනු ලැබූ විට රුපියල් පනහකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතුය." යන වචන වෙනුවට "වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්සියයකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතුය." යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 255 වන වගන්තිය සංශෝධනය කිරීම.

**58.** 1979 අංක 42 දරන පනතින් අවසන් වරට සංශෝධනය කරන ලද ප්‍රධාන ප්‍රඥප්තියේ 255 වන වගන්තිය පහත දක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:—

(අ) ඒ වගන්තියේ (ඇ) ඡේදයේ "දවසකට ශත පහක් නොඉක්මවන අය කිරීමක්" යන වචන වෙනුවට "දවසකට රුපියල් හැත්තෑ පහක් නොඉක්මවන අය කිරීමක්" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) ඒ වගන්තියේ (ඇ) ඡේදයේ "දවසකට ශත හත්තෑපහක් නොඉක්මවන අය කිරීමක්" යන වචන වෙනුවට "දවසකට රුපියල් හැත්තෑ පහක් නොඉක්මවන අයකිරීමක්" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(ඇ) ඒ වගන්තියේ (ඉ) ඡේදයේ "ශත විසිපහක් නොඉක්මවන අයකිරීමක්" යන වචන වෙනුවට "රුපියලක් නොඉක්මවන අයකිරීමක්" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 256 වන වගන්තිය සංශෝධනය කිරීම.

**59.** ප්‍රධාන ප්‍රඥප්තියේ 256 වන වගන්තියේ "රුපියල් එක් දහස" යන වචන යෙදෙන සෑම තැනකම ඒ වචන වෙනුවට "රුපියල් දස දහස" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 266අ අළුත් වගන්තිය ඇතුළත් කිරීම.

**60.** ප්‍රධාන ප්‍රඥප්තියේ 266 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අළුත් වගන්තිය ඇතුළත් කරන අතර එය ඒ ප්‍රඥප්තියේ 266අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතුය:—

"සභාවට අයවිය යුතු මුදල් අත්හැර දැමීම.

266අ. අත්හැර දමනු ලබන මුදල නොසැලකිය යුතු තරම් වන බව හෝ අයකරගත නොහැකි බව හෝ එම මුදල ගෙවීමට යටත් තැනැත්තාගේ දිළිඳු බව උඩ එම මුදල ලියා අත්හැරිය යුතු බව සභාවට පෙනී ගියහොත් (252 වන වගන්තියේ (2) වන උපවගන්තියෙන් අත්හැර දැමීම සඳහා විධිවිධාන සලස්වන ලද මුදලක් නොවන) සභාවට යම් පුද්ගලයකුගෙන් අයවිය යුතු යම් සම්පූර්ණ මුදලක් හෝ ඒ මුදලින් යම් කොටසක් හෝ යෝජනා සම්මතයක් මගින් සභාව විසින් අත්හැර දමනු ලැබිය හැකි ය. රුපියල් එක් දහස ඉක්මවන මුදලක් අත්හැර දැමීමට අදාළ වන එවැනි සෑම යෝජනා සම්මතයක් ම අමාත්‍යවරයාගේ අනුමතයට යටත් විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 297 වන වගන්තිය සංශෝධනය කිරීම.

**61.** ප්‍රධාන ප්‍රඥප්තියේ 297 වන වගන්තියේ "වරදකරු කරනු ලැබූ විට, ඔහු එසේ ප්‍රතික්ෂේප කිරීම කරගෙන ගිය සෑම දවසක් සඳහා රුපියල් පනහකට නොවැඩි දඩයකට ද යටත් විය යුතුය." යන වචන වෙනුවට "වරදකරු කරනු ලැබූ විට. ඔහු එසේ ප්‍රතික්ෂේප කිරීම කරගෙන ගිය සෑම දවසක් සඳහා රුපියල් පන්සියයකට නොවැඩි දඩයකට ද යටත් විය යුතුය" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 299 වන වගන්තිය සංශෝධනය කිරීම.

**62.** ප්‍රධාන ප්‍රඥප්තියේ 299 වන වගන්තියේ (3) වන උපවගන්තියේ "වරදකරු කරනු ලැබූ විට රුපියල් පනහකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතුය." යන වචන වෙනුවට "වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්සියයකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතුය." යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 308 වන වගන්තිය සංශෝධනය කිරීම.

63. ප්‍රධාන ප්‍රඥප්තියේ 308 වන වගන්තියේ "ඒ වරද සිදු කිරීමෙන් පසු ඊළඟට එළඹෙන මාස තුන ඇතුළත" යන වචන වෙනුවට "ඒ වරද සිදුකිරීමෙන් පසු ඊළඟට එළඹෙන මාස හය ඇතුළත" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය සංශෝධනය කිරීම.

64. ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනයේ 2 වන ඡේදයේ (ඉ) ශීර්ෂයට ඉක්බිතිව ම පහත දැක්වෙන අළුත් ශීර්ෂය ඇතුළත් කිරීමෙන් ඒ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(ඊ) පුපුරණ ද්‍රව්‍ය ආඥාපනත, 1902.".

## II වන කොටස

255 වන අධිකාරයේ 10 වන වගන්තිය සංශෝධනය කිරීම.

65. 1967 අංක 2 දරන පනතින් අවසන්වරට සංශෝධනය කරන ලද (මෙහි මේ කොටසෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) නගර සභා ආඥාපනතේ 10 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:—

(අ) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "එසේ ආරම්භ වීමෙන් පසුව" යන වචනවල සිට ඒ උපවගන්තියේ අවසානය දක්වා වූ සියළු වචන වෙනුවට පහත දැක්වෙන වචන ආදේශ කිරීමෙන්:—

"ඒ සභිකයාගේ මරණය, ඉල්ලා අස්වීම හෝ ඉවත් කිරීම හේතුකොටගෙන ඔහුගේ ධූරය කලින් හිස් කරනු ලැබුවේ නම් මිස, ඒ ධූර කාලය ආරම්භ වූ දිනයේ සිට, මාස හතලිස් අටක කාලයක් සඳහා ඒ සභිකයා ධූරය දැරිය යුතුය."; තවද

(ආ) ඒ වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:—

"(2) අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් —

"(අ) ධූර කාලය අවසන් වන දිනය වෙනුවට ඒ වර්ෂයේ හෝ ඒ වර්ෂයට පෙරාතුව වූ වර්ෂයේ ඒ ධූර කාලය අවසන් වන මාසයට පෙරාතුව වූ යම් මාස යක දිනයක් ආදේශ කිරීම නියම කිරීමෙන් (1) වන උපවගන්තියේ සඳහන් ධූර කාලය කෙටි කළ හැකිය; තවද

(ආ) (I) වන උපවගන්තිය යටතේ ධුර කාලය අවසන් වන දිනය වෙනුවට හෝ මේ උපවගන්තියේ (අ) ඡේදය යටතේ නියම කරනු ලබන දිනය වෙනුවට, ඒ වර්ෂයේ හෝ එසේ නිශ්චිතව සඳහන් කරන ලද හෝ නියම කරන ලද වර්ෂයට ඉක්බිතිවම වූ යම් වර්ෂයක ධුර කාලය අවසන් වන දිනයට පසුව වූ යම් මාසයක දිනයක් නියම කිරීමෙන් එකී ධුර කාලය දීර්ඝ කළ හැකි අතර, ඉන්පසුව අවසාන නියමයේ නිශ්චිතව සඳහන් ධුර කාලය අවසාන වන දිනය වෙනුවට පසුව වූ යම් දිනයක් නියම කිරීමෙන් එකී ධුර කාලය කලින් කල දීර්ඝ කළ හැකි ය :

එසේ වුව ද, ඒ ධුර කාලය දීර්ඝ කරන කාල සීමාව හෝ ඒ ධුර කාලය කලින් කල දීර්ඝ කරන කාලසීමාවල එකතුව මාස දොළහකට වැඩි නොවිය යුතු ය.".

66. 1983 අංක 13 දරන පනතින් සංශෝධනය කරන ලද ප්‍රධාන ප්‍රඥප්තියේ 36 වන වගන්තියේ (1983 අංක 13 දරන පනතින් ඇතුළත් කරන ලද (ii) වන ඡේදය සඳහා පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 36 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(iii) අමාත්‍යවරයාගේ පූර්ව අනුමතය ඇතිව—

(i) මහා නගර සභා ආඥාපනත සහ නගර සභා ආඥාපනත යටතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ පිළිවෙළින් යම් මහා නගර සභාවක් විසින් හෝ නගර සභාවක් විසින් පිහිටුවා පවත්වාගෙන යනු ලබන, අවස්ථාවෝචිත පරිදි පොදු සේවාවන් හෝ මහජන අර්ථසාධක සේවාවන් සඳහා අවශ්‍ය විය හැකි යන්ත්‍රෝපකරණ, උපකරණ, භාණ්ඩ, ද්‍රව්‍ය සහ බඩු නිෂ්පාදනය සහ සැදීම සඳහා වාණිජ සහ කර්මාන්ත ව්‍යවසායවල නිරත වීම ; සහ

(ii) ඒ යන්ත්‍රෝපකරණ, උපකරණ, භාණ්ඩ, ද්‍රව්‍ය හෝ බඩු, සභාව විසින් නිර්ණය කොට අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන මිල ගණන්වලට වෙනත් යම් මහා නගර සභාවකට හෝ නගර සභාවකට හෝ මහජනයාට විකිණීමට.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 159 වන වගන්තිය සංශෝධනය කිරීම.

**67.** 1984 අංක 48 දරන පනතින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 159 වන වගන්තිය, එහි (ඊ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අළුත් ඡේදය ඇතුළත් කිරීමෙන් මෙයින් තව දුරටත් සංශෝධනය කරනු ලැබේ :—

"(ඊඊ) සභිකයන්ගේ නිවාසස්ථානවලට නිල දුරකථන පහසුකම් සවිකිරීම සහ නඩත්තු කිරීම පිණිස සභාව විසින් දරනු ලබන සියලු වියදම් ;".

ප්‍රධාන ප්‍රඥප්තියේ 160 වන වගන්තිය සංශෝධනය කිරීම.

**68.** 1985 අංක 20 දරන පනතින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 160 වන වගන්තියේ (4) වන උපවගන්තිය ඉවත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 165අ වගන්තිය සංශෝධනය කිරීම.

**69.** ප්‍රධාන ප්‍රඥප්තියේ 165අ වගන්තියේ (4) වන උපවගන්තියේ "ඒ සභාව පිහිටි" යන වචන වෙනුවට සහ "සභාව විසින් වාර්තා කළ යුතුය" යන වචන වෙනුවට පිළිවෙළින් "සභාව පිහිටි" යන වචන සහ "ලේකම්වරයා විසින් වාර්තා කළ යුතුය." යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 165ආ වගන්තිය සංශෝධනය කිරීම.

**70.** 1985 අංක 20 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ (1979 අංක 42 දරන පනතින් ඇතුළත් කරන ලද) 165ආ වගන්තියේ (3) වන උපවගන්තියේ "ඒ සභාව පිහිටි" යන වචන වෙනුවට සහ "සභාව විසින් වාර්තා කළ යුතුය." යන වචන වෙනුවට පිළිවෙළින් "සභාව පිහිටි" යන වචන සහ "ලේකම්වරයා විසින් වාර්තා කළ යුතුය." යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 165 ඇ වගන්තිය සංශෝධනය කිරීම.

**71.** (1979 අංක 42 දරන පනතින් ඇතුළත් කරන ලද) ප්‍රධාන ප්‍රඥප්තියේ 165ඇ වගන්තියේ (2) වන උපවගන්තියේ "සභාව විසින් වාර්තා කළ යුතුය." යන වචන වෙනුවට "ලේකම්වරයා විසින් වාර්තා කළ යුතුය." යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

පාර්ලිමේන්තු සභාවේ කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් [illegible]